# An Investigative Study on *Dharmavāda* which is originated through Dhamma Entity and Non Substantiality of Elements

ධර්ම අස්තීත්වය හා ධර්ම නෛරාත්මය තුළින් බිහි වූ ධර්මවාදය පිළිබඳ විර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

ථෙරවාද හා මහායාන දාර්ශනික සම්ප්‍රදායයන් දාර්ශනික වශයෙන් වෙන් වන්නා වූ මූලික ඉගැන්වීම වනුයේ ධර්ම අස්තිත්වය හා ධර්ම නෛරාත්මය පිළිබඳ මතවාදයයි. විශේෂයෙන් ථෙරවාද සම්ප්‍රදායට අයත් බොහෝ ගුරුකුල, පරමාර්ථ ධර්ම විග්‍රහය තුළ ධර්ම අස්තිත්වයක් අවධාරණය කොට ඇත. මෙහි දී ස්ථවිරවාද, සර්වාස්තිවාද යන ගුරුකුල ප්‍රමුඛය. ථෙරවාද අභිධර්මයට අනුව සම්මුති වශයෙන් පුද්ගලයෙක් දක්වුව ද එහි පරමාර්ථය වනුයේ ධර්ම සමූහයකගේ එකතුවක් පමණි. එම ධර්ම ද චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ යනුවෙන් පරමාර්ථ ධර්ම හතරකට බෙදා දක්වා ඇත, මෙය ධර්ම අස්තීත්වය පිළිබඳ මූලික ඉගැන්වීමයි. මේ හා සමාන වූ ඉගැන්වීමක් සර්වාස්තිවාද සම්ප්‍රදාය තුළ ද දැකගැනීමට හැකියාව ඇත. ඔවුන් ද චිත්ත, චෛත්ත, රූප, චිත්ත විප්‍රයුක්ත සංඛාර, අසංස්කෘත යනුවෙන් ධර්මයන්ගේ අස්තීත්වය පෙන්වා දුන්හ. එසේම මෙම ධර්මගේ අස්තීත්වය පමණක් නොව එම ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳ අවස්ථා කීපයක් ද ඔවුහු ඉස්මතු කළහ. ඒ අනුව ථෙරවාදීහු උප්පාද, ඨිති, භංග යනුවෙන් ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳ අවස්ථා තුනක් ද, සර්වාස්තිවාදීහු උප්පාද, ස්ථිති, ජරතා, අනිත්‍යතා යනුවෙන් අවස්ථා හතරක් ද ඉදිරිපත් කළහ. මේ අනුව ථෙරවාද සම්ප්‍රදායට අයත් ගුරුකුලයන් තුළ ධර්මයන්ගේ පැවැත්මක් අවධාරණය කරන බැවින් ඔවුන් ධර්මයන් පිළිබඳ පුද්ගල ප්‍රත්‍යක්ෂය ලබාගත හැකි බව පෙන්වා දුන්හ. **බාහ්‍යාර්ථප්‍රත්‍යක්ෂවාදය** ලෙස දැක්වෙන්නේ එම ඉගැන්වීමයි. නමුත් මහායානට අයත් බොහෝ සම්ප්‍රදායයන් තුළ දක්නට ලැබෙන්නේ මෙයට බොහෝ සෙයින් ප්‍රතිවිරුද්ධ වූ ආකල්පයකි. ඔවුන් ථෙරවාදී සම්ප්‍රදායයන් තුළ ඉගැන්වූ පුද්ගල නෛරාත්මය මෙන්ම, ධර්ම පිළිබඳව ද නෛරාත්මයක් දක්වයි. ඒ අනුව ලොව පුද්ගලයෙක් හෝ ධර්ම යනුවෙන් අස්තීත්වයක් නොමැත. මෙම ඉගැන්වීම ඍජු වශයෙන් දක්නට ලැබෙන්නේ මහායාන දර්ශනයට අයත් ශ්‍රේෂ්ඨ දාර්ශනික ඉගැන්වීම් දෙකක් ලෙස සළකනු ලබන මාධ්‍යමක ශූන්‍යතාවාදය තුළ හා යෝගාචාර විඥානවාදය තුළිනි. මාධ්‍යමකයෝ හේතු-ඵල ධර්මතාවය පදනම් කොටගෙන ලොව සියල්ල යථාර්ථවාදීව ශූන්‍යතා ලක්ෂණයෙන් යුක්ත බව දැක්වූහ. එහි දාර්ශනික අර්ථය වනුයේ යමක් හේතු-ඵලයන් තුළින් නිර්මාණය වේද, ඵලය තුළ හේතුව ගැබ්ව පවත්නා බැවින් ලොව පවතින්නා වූ සියල්ල ද්වයතාවයක් මිස, ස්ව ධර්මතාවයක් නොමැති බවයි. එහෙයින් ධර්මයන්ගේ අස්තීත්වයක් පෙන්වාදිය නොහැක. මෙම ඉගැන්වීමට සමාන වූ ඉගැන්වීමක් දක්වන යෝගාචාරීහු ද ලොව සියල්ල චිත්තමාත්‍රයක්, විඥප්තිමාත්‍රයක්, හුදු සිතිවිල්ලක් පමණක් බව අවධාරණය කරති. යම් සේ "තිමිර" නම් වූ රෝගයෙන් පෙලෙන්නා වූ පුද්ගලයෙකුට අවිද්‍යමාන වූ හිරු, සඳු, තාරකා, කෙස් ආදිය දර්ශනය වේද, එසේම පුද්ගලයා විසින් ම ලොව සියල්ල ස්ව චිත්තයෙන්ම ඇතැයි නිර්මාණය කරගනු ලබයි. නමුත් එහි යථාර්ථය විඥප්තිමාත්‍රයක් පමණි. එම කිසිදු ධර්මයක් තුළ අස්තීත්වයක් නොමැත. මෙසේ ධර්ම

අස්තීත්වය හා ධර්ම නෛරාත්මය තුළින් නිර්මාණය වූ ධර්මවාදය බුදුදහම දාර්ශනික වශයෙන් වෙන් කිරීමට පාදක වී ඇති බව අධ්‍යයනය කළ හැක.

ප්‍රමුඛ පදඃ  ථේරවාදය, මහායානය, ධර්ම අස්තීත්වය, ධර්ම නෛරාත්මය, ධර්ම වාදය

***Keywords: Thevāda, Mahāyāna, Dhamma entity, Non-substantiality of elements, Dharmavāda***